# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
# University of Kelaniya - Sri Lanka
## Centre for Distance and Continuing Education

## සවිස්තරාත්මක අධ්‍යයන වාර්තා ලබාගැනීම හා උපාධි ප්‍රදානෝත්සවය සඳහා අයදුම් කිරීම
## Obtaining Academic Records and applying for the Convocation

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) හා ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පරීක්ෂණයන්ට අදාළව 2026 ජනවාරි මස 27 දින නිකුත් කරන ලද උපාධිලාභී නාමලේඛනයන් හි නම් සඳහන් උපාධිලාභීන් හට සවිස්තරාත්මක අධ්‍යයන වාර්තාව (Academic Record) කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතියෙන් පසු **2026 පෙබරවාරි මස 02 දින සිට 13 දින දක්වා සතියේ දිනයන්හි දී** ලබාගත හැක.
The Academic Records of the graduates whose names appear in the lists of graduates issued on 27th January 2026, in respect of the Bachelor of Business Management (General) and Bachelor of Arts (General) degree examinations, can be obtained on weekdays from 02nd to 13th February 2026, after approval of the Senate of the University of Kelaniya.

ඒ සඳහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවියට පිවිස බාගත කරගත් අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නියමිත මුදල් ගෙවීමෙන් අනතුරුව පහත දැක්වෙන **එක් ක්‍රමයක්** මගින් ලබාගැනීමට හැකියාව පවතී.
For this purpose, the application form may be downloaded from the website of the Centre for Distance and Continuing Education, duly completed, and submitted together with the prescribed fee through one of the following methods.

01. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත මධ්‍යහ්න 12.00 ට පෙර ගෙනැවිත් බාරදීමෙන් එදිනම ලබාගත හැක. The duly completed application form together with the paid voucher should be submitted to the Centre for Distance and Continuing Education before 12.00 noon, and the relevant documents may be collected on the same day.

02. අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත **"නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, අංක. 56/6, කෝන්ගහවත්ත පාර, නුවර පාර, කිරිබත්ගොඩ."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීමෙන් පසු තම පෞද්ගලික ලිපිනයට ගෙන්වා ගත හැක. The duly completed application form together with the paid voucher may be sent by registered post to the address "Deputy Registrar, Centre for Distance and Continuing Education, No. 56/6, Koongahawatta Road, Kandy Road, Kiribathgoda." The relevant documents will thereafter be sent to the applicant's postal address.

එසේම ඉහත උපාධි පාඨමාලාවට අදාළ උපාධිලාභීන් සඳහා නියමිත උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත් 2026.02.02 දින සිට අප වෙබ් අඩවියෙන් (www.cdce.kln.ac.lk) බාගත කර ගැනීමේ හැකියාව පවතින අතර එසේ බාගත කරගත් අයදුම්පත් 2026.02.16 දිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කර ඉහත දක්වා ඇති ලිපිනයට තැපැල් කළ යුතුය.
Further, applications for the Convocation for graduates of the above degree courses may be downloaded from our website (www.cdce.kln.ac.lk) with effect from 02nd February 2026. The duly completed applications should be completed as prescribed and sent by post to the above address on or before 16th February 2026.

නියෝජ්‍ය ලේඛකාධිකාරී / Deputy Registrar,
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය / Centre for Distance and Continuing Education,
කැලණිය විශ්වවිද්‍යාලය / University of Kelaniya,
කැලණිය / Kelaniya.
2026.01.30